ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

නියාමක ප්‍රශ්න පත්‍රය

අදියර 01

1604 – ව්‍යාපාර පරිසරය [BEN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
1604 - ව්‍යාපාර පරිසරය (BEN)
නියාමක ප්‍රශ්න පත්‍රය

අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) ඃ

දෙනු ලබන කාලයඃ

- ලිවීම සඳහා පැය 03 යි.

ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- A කොටසේ, B කොටසේ සහ C කොටසේ සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

ලකුණුඃ

- එක් එක් කොටස සඳහා ලකුණු ඃ

කොටස	ලකුණු
A	40
B	40
C	20
එකතුව	**100**

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50 කි.

උත්තරඃ

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා සලකා බලන්නේ නැත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

උත්තර පොත්ඃ

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

ගණකයන්ත්‍රඃ

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

ඇමුණුම්ඃ-

- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

වාස්ථවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)
අනිවාර්ය ප්‍රශ්න 20 කි.

A කොටස

එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40

01 වන ප්‍රශ්නය

අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 සීමාසහිත පොදු සමාගමක අවම කොටස්කරුවන් ගණන වන්නේ

(1) 1. (2) 2. (3) 20. (4) 100.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානයක ප්‍රධාන මූලිකාංගයක් වශයෙන් **නොසැලකෙන්නේ** කුමක්ද ?

(1) පොදු අරමුණු .
(2) පුද්ගල කණ්ඩායමක්.
(3) ව්‍යුහය.
(4) ලාභය.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙළඳපොළේ සහභාගීකරුවෙක් වන්නේ කවුරුන්ද ?

(1) රජය.
(2) වාණිජ බැංකු.
(3) රක්ෂණ ආයතන.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත ප්‍රකාශන සලකා බලන්න.

(a) ව්‍යාපාර ආචාර ධර්ම සංග්‍රයක් ස්ථාපිත කිරීම මගින් ව්‍යාපාර කෙරෙහි ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය සහතික කෙරේ.

(b) ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපාරවලට සාර්ථක ලෙස තරඟ කිරීමට හැකිය.

(c) ආචාරධර්ම සංග්‍රහය පිළිපැදීමෙන් සමාගමේ කීර්තිනාමය අඩු වීමට හේතු වේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක ආචාරධර්ම සංග්‍රහය සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය /ප්‍රකාශ වන්නේ

(1) **(a)** පමණි.
(2) **(a)** සහ **(b)** පමණි.
(3) **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, බද්ධ ව්‍යාපාරයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

(2) එය කෙටිකාලීන අරමුණක් සඳහා ආරම්භ කර ඇත.

(3) ලියාපදිංචිය අනිවාර්ය වේ.

(4) පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් සහභාගී වේ.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, රක්ෂණ මූලධර්මයක් **නොවන්නේ** කුමක්ද ?

(1) රහස්‍යභාවය.

(2) හානි පූර්ණය.

(3) ආසන්නතම හේතුව.

(4) උපරිම විශ්වාසය.

1.7 පහත සඳහන් ආයතන අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු **නොලබන්නේ** කුමක් ද?

(1) සේවක අර්ථසාධක අරමුදල (EPF)

(2) බලපත්‍රලාභී විශේෂිත බැංකු

(3) ලියාපදිංචි කල්බදු සමාගම්

(4) සේවක භාර අරමුදල (ETF)

1.8 වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්, චෙක්පතක වලංගු කාලය වන්නේ:

(1) දින 30 කි. (2) මාස 03 කි. (3) මාස 04 කි. (4) මාස 06 කි.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, මුදලේ කාර්යයක් ලෙස සලකන්නේ කුමක්ද ?

(1) හුවමාරු මාධ්‍යයක් වීම.

(2) වටිනාකමේ සන්නිධියක් වීම.

(3) වටිනාකමේ මිනුම් දණ්ඩක් වීම.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.10 පහත ප්‍රකාශ අතුරෙන් විද්‍යුත් මුදල් (E-money) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) මාර්ගගත සාප්පු සවාරි (online shopping) සඳහා විද්‍යුත් මුදල් භාවිතා කළ නොහැක.

(2) විද්‍යුත් මුදල් භෞතිකව කාසි වශයෙන් පමණක් පවතී.

(3) විද්‍යුත් මුදල් ලෙස ණයපත් භාවිතා කෙරේ.

(4) විද්‍යුත් මුදල් ගණුදෙනු සඳහා මුහුණට මුහුණ හමුවීම අවශ්‍ය වේ.

අංක **1.11** සිට එකේ **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.11 ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළට කොටස් වෙළඳපොළ පමණක් ඇතුළත් වේ.

1.12 රජය, ව්‍යාපාරවලට බලපෑම් කරන එක් ක්‍රමයක් වන්නේ බදු දිරි ගැන්වීම් ලබාදීම වේ.

1.13 ආයතනික සමාජ වගකීම් සඳහා වන ක්‍රියාකාරකම්, මූල්‍ය පරිත්‍යාග ලෙස පමණක් වර්ගීකරණය කරනු ලැබේ.

1.14 බැංකුවකට චෙක්පතක රේඛණය අවලංගු කළ හැකිය.

1.15 චෙක්පතක් නිසි ලෙස ලියා නොමැති විට, එය අගරු විය හැකිය.

1.16 සිට **1.20** දක්වා ඇති ප්‍රශ්න වලට උත්තර ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.16 තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිකරුවන් දෙදෙනෙකු (02) සඳහන් කරන්න.

1.17 "මුදල් වෙළඳපොළ" සහ "ප්‍රාග්ධන වෙළඳපොළ" අතර වෙනස්කම් දෙකක් (02) සඳහන් කරන්න.

1.18 "තිරසාර සංවර්ධනය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.19 ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා සපයා ඇති පහසුකම් දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.20 රජයේ අරමුණු දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 2 බැගින්, ලකුණු 40)

A කොටසේ අවසානය

අනිවාර්ය ප්‍රශ්න(04) හතරකි.
(මුළු ලකුණු 40)

B කොටස

02 වන ප්‍රශ්නය

BrightTech Solutions ආයතනය මෘදුකාංග සංවර්ධනය සඳහා විශේෂිත වන අතර තාක්ෂණ කර්මාන්තයේ මෙහෙයුම් කටයුතු සිදු කරයි. සීමිත පෞද්ගලික සමාගමක් ලෙස, එහි අරමුණු වනුයේ ලාභ ඉපයීම සහ තාක්ෂණික නවෝත්පාදනයයි. එය සේවකයින් 150 කින් සමන්විත මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයක් වන අතර පැහැදිලි වාර්තා කිරීමේ මට්ටම් සහ සංවිධාන ධූරාවලියකින් සමන්විත සංවිධානමය ව්‍යුහයක් යටතේ ක්‍රියාත්මක වේ. සමාගම, තොරතුරු තාක්ෂණ කර්මාන්තය තුළ ක්‍රියාත්මක වන අතර, එහි ලක්ෂණ වනුයේ සීඝ්‍ර නවෝත්පාදන කටයුතු, කුසලතා සහිත සේවකයින් මත රැඳීම, සහ දැඩි තරඟකාරී පරිසරය වේ. **BrightTech** හි ව්‍යුහය සහ කර්මාන්තයට ඇති නැඹුරුව මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගැනීමටත් වෙළඳපොළ ඉල්ලුමට අනුවර්තනය වීමටත් ඉඩ සලසයි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) **BrightTech Solutions** ආයතනය උදාහරණයක් ලෙස යොදා ගනිමින්, තාක්ෂණ කර්මාන්තයේ නිරත සීමාසහිත පෞද්ගලික සමාගමක ප්‍රධාන ලක්ෂණ තුනක් (03) **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

(b) ඒකපුද්ගල ව්‍යාපාරයක ලක්ෂණ (03) ක් **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) ව්‍යාපාර සංවිධානයක ලක්ෂණ (උදා: අරමුණ, හිමිකාරීත්වය, ප්‍රමාණය, ව්‍යුහය සහ කර්මාන්ත වර්ගීකරණය) **BrightTech Solutions** හි මෙහෙයුම් කෙරෙහි බලපාන ආකාරය **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය

SpeedLink Logistics යනු සිල්ලර ව්‍යාපාර සඳහා ඉක්මනින් සහ ආරක්ෂිතව භාණ්ඩ බෙදා හැරීම මඟින් සහය දක්වන ප්‍රවාහන සහ සැපයුම් සේවා සමාගමකි. මාර්ගගත වෙළඳාමේ (online shopping) ඉහළ යාමත් සමග භාණ්ඩ නියමිත වේලාවට පාරිභෝගිකයන් වෙත ළඟා වන බව සහතික කිරීම සඳහා **SpeedLink Logistics** ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. සඵලදායි සන්නිවේදන ක්‍රම මගින් ඇනවුම් නිරීක්ෂණය කිරීමටත්, තත්කාලීනව (real Time) පාරිභෝගිකයන් යාවත්කාලීන කිරීමටත් උපකාරී වේ. විශ්වාසනීය ප්‍රවාහනයක් සහ රක්ෂණයක් ලබා දීම මගින් **SpeedLink Logistics** ව්‍යාපාරයේ කාර්යක්ෂමතාව ඉහළ නංවන අතර පාරිභෝගික තෘප්තිය ඉහළ නංවනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) **SpeedLink Logistics** ආයතනය සඳහා ප්‍රවාහනය වැදගත් වීමට හේතු දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සඵලදායී සන්නිවේදන පද්ධතියක තිබිය යුතු ගුණාංග හතරක් (04) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) උපකාරක සේවා සැපයීමේදී **SpeedLink Logistics** වැනි සමාගම් සඳහා සන්නිවේදනයේ වැදගත්කම් දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය

සීමාසහිත Lanka Organics (පෞද්ගලික) සමාගම, ශ්‍රී ලංකාවේ කාබනික කුළුබඩු සහ තේ අපනයනකරුවෙකු වන අතර, ගෝලීය වෙළඳපොළට ළඟාවීම සඳහා භාවිතා වන නවතම ප්‍රවණතාවයක් වන මාර්ගගත වේදිකා (online flatform) ක්‍රමය වෙත පිවිසෙන ලදී. තිරසාර මූලාශ්‍ර මගින් සපයන නිෂ්පාදිත සඳහා වන ඉල්ලුම වැඩි වීමත් සමඟ, සමාගම සාධාරණව වෙළඳාම් කරන සැපයුම්කරුවන් සමග හවුල් වූ අතර, එහි සැපයුම් දාමයේ විනිවිද භාවය සහතික කිරීම සඳහා ගුටක දාම (Block chain) තාක්ෂණය යොදා ගන්නා ලදී. ඒ සමඟම, දේශීය සිල්ලර වෙළඳුන් විසින් ගෝලීය පරිසර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පරිසර හිතකාමී විසඳුම් නව ප්‍රවණතාවලට අග්නිදිග ආසියාවෙන් ආනයනය කිරීම ආරම්භ කරන ලදී. මෙම වෙනස්කම් මගින් සිල්ලර වෙළඳාම, ආනයන සහ අපනයන ක්ෂේත්‍රවල නව ප්‍රවණතා ගෝලීය පරිසරය, තිරසරභාවය සහ ඩිජිටල් පරිවර්තනය අරමුණු කර ගත් අන්තර්ජාතික වෙළෙඳ නියාමනවලින් කෙසේ බලපෑමට ලක්වන්නේද යන්න පිළිබිඹු කරයි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) සිල්ලර වෙළඳාමේ සහ අපනයනයේ ඇති නව ප්‍රවණතා, **සීමාසහිත Lanka Organics (පෞද්ගලික) සමාගම** වැනි ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාර තුනක් (03) ක් **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ආනයන සහ අපනයනය තීරණ කෙරෙහි ගෝලීය පරිසරය බලපාන ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය

ගාල්ල ප්‍රදේශයේ තරුණ උපාධිධාරියෙකු වන **තරිඳු,** පරිසර හිතකාමී කොහු ආශ්‍රිත ගෘහභාණ්ඩ අයිතම නිෂ්පාදනය කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. සීමිත ප්‍රාග්ධනයක් සහිතව ඔහු විසින් "එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා" යෝජනා ක්‍රමය යටතේ ආරම්භක ණය මුදලක් ලබා ගන්නා ලදී. ඔහුගේ අලෙවිකරණ සහ මූල්‍ය කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියෙන් **(NEDA)** ව්‍යාපාර පුහුණුවක් ඔහු ලබා ගන්නා ලදී. වර්ධනය වන දේශීය ඉල්ලුම සහ මාර්ගගත විකුණුම් හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයකදී තම නිෂ්පාදිත ප්‍රදර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් **තරිඳු** තෝරා ගන්නා ලදී. ඔහුගේ ගමන මගින් ව්‍යවසායකත්වය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහාය වැඩ සටහන් නවෝත්පාදනයට, රැකියා උත්පාදනයට සහ අපනයන විභවය වැඩි කිරීමට ජාතික ආර්ථිකයේ වර්ධනයට මගපෙන්වන ආකාරය පෙන්නුම් කෙරේ.

ඔබ විසින් කළයුතු දෑ :

(a) **තරිඳුගේ** ව්‍යාපාරයේ සාර්ථකත්වයට මූල්‍යමය සහ ආයතනික සහයෝගය දායකවන ආකාර දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **තරිඳුගේ** ව්‍යාපාරය වැනි කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර, රටේ ආර්ථික සංවර්ධනයට දායකවන ආකාරයන් තුනක් (03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

B කොටසේ අවසානය

අනිවාර්ය ප්‍රශ්ණයකි

(මුළු ලකුණු 20)

C කොටස

06 වන ප්‍රශ්නය

සීමාසහිත Green Valley Organics (පෞද්.) සමාගම (GVO) යනු ශ්‍රී ලංකාවේ කාබනික ආහාර නිෂ්පාදිත නිෂ්පාදනය කරනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි. (SME) සමාගම සෞඛ්‍ය පිළිබඳ ඉහළ නැඹුරුතාවයක් ඇති තරඟකාරී වෙළඳපොළක් තුළ ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය වසර කිහිපය තුළ ආයතනයේ පාරිභෝගික පදනම ඉහළ ගොස් ඇත .

GVO විසින් පහසුවෙන් සොයාගත නොහැකි පුළුල් පරාසයක කාබනික නිෂ්පාදිත ඉදිරිපත්කොට ඇත. සමාගම කාබනික ආහාර සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් සහිත දැඩි තදබදයක් සහිත ප්‍රදේශයක පිහිටා ඇත. එහි ප්‍රතිපලයක් ලෙස සමාගම තම සන්නාමය පාරිභෝගිකයන් අතර දැඩි ලෙස ස්ථාපිත කොට ඇත.

කෙසේවුවද කාබනික නිෂ්පාදිත ලබා ගැනීමේදී **GVO** හට ඉහළ වියදමක් දැරීමට සිදුවී ඇත. ඊට අමතරව, කාබනික නිෂ්පාදිත සම්බන්ධ පාලන රෙගුලාසිවල නිතර සිදුවන වෙනස් වීම් නිසා අමුද්‍රව්‍ය සැපයුම් උච්ඡාවචනයන්ට ලක්ව ඇත. මාර්ගගත පැවැත්ම ගොඩනැගීම සඳහා **GVO** පළමු පියවරයන් තබා ඇත. තවද, තම පාරිභෝගිකයන්ගේ විවිධ වූ රුචිකත්වයන් තෘප්තිමත් කිරීම සඳහා නව නිෂ්පාදිත හඳුන්වා දීම සඳහා **GVO** සක්‍රීයව පරීක්ෂණ කරගෙන යයි.

මෙම ව්‍යාපාරය සීමිත පෞද්ලික සමාගමක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් සීමිත වගකීම් සහ ණය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීම වැනි වාසි ලැබේ. කෙසේ වුවද, මෙමගින් සමාගමේ කොටස් හුවමාරු සඳහා සීමා පැවතීම සහ දැඩි නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වීමට සිදුව ඇත. **GVO** හි සාර්ථකත්වය සඳහා සැපයුම් දාම කළමනාකරණය, තොරතුරු තාක්ෂණ සහය සහ තත්ව සහතික කිරීම වැනි සහයක සේවාවන් ඉතා වැදගත් වේ. මෙම සේවාවන් කාර්යක්ෂම කළමනාකරණය කිරීම මගින් නිෂ්පාදන කටයුතු කාලසීමාවන්ට අනුව වීම සහ ස්ථාවර නිෂ්පාදිත ගුණත්වයක් සහතික කෙරේ.

කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ බොහෝ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර මෙන් **Green Valley** සමාගම මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශය නොමැති වීම, ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් නොමැතිකම සහ ජාත්‍යන්තර වෙළඳපොළට ව්‍යාප්ත වීමේ දුෂ්කරතා වැනි අභියෝගවලට මුහුණ දේ. පාරිභෝගිකයින්, සැපයුම්කරුවන් සේවකයින්, රාජ්‍ය නියෝජිත ආයතන සහ ආයෝජකයන් ඇතුළු ඇල්මැති පාර්ශවයන් සංවිධානයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාමේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මෙම ඇල්මැති පාර්ශවකරුවන් සමග පවතින ධනාත්මක සබඳතා ව්‍යාපාර තිරසාර භාවය සහ අනාගත වර්ධනය සහතික කරනු ලබයි.

ඔබ විසින් කලයුතු දෑ:

(a) ශදූඅත (SWOT) විශ්ලේශණය භාවිතයෙන්, **GVO** හි ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න.**

(ලකුණු 06)

(b) **GVO** සමාගම, සීමාසහිත පෞද්ගලික සමාගමක් වීමේ වාසි දෙකක් (02) සහ අවාසි දෙකක් (02) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) **GVO** හි මෙහෙයුම් සඳහා අවශ්‍ය උපකාරක සේවා තුනක් (03) ක් **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(d) ශ්‍රී ලංකාවේ කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙක් **(SME)** ලෙස **GVO** මුහුණ පාන අභියෝග දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(e) **GVO** හි ඇල්මැති පාර්ශව දෙකක් (02) **හඳුනාගෙන** ව්‍යාපාරයට ඔවුන්ගේ බලපෑම **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

C කොටසේ අවසානය

කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

මට්ටම	ක්‍රියා ලැයිස්තුව	නිර්වචනය	සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්
මතක තබා ගැනීම කරුණු,පද,මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ	හඳුනා දක්වන්න.	කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම.	මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න.
	නිර්වචනය කරන්න.	වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම.	පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම.
	හඳුනා ගන්න	පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය.	පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම.
	සඳහන් කරන්න	පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම.	ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකශ කිරීම.
	ලැයිස්තුගත කරන්න	නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්.	ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම.
	සටහන් කරන්න	පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම.	අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම.
අවබෝධය තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම	ගොඩ නගන්න	මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම.	විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම.
	වෙනස් කොට දක්වන්න	දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම.	සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම.
	විමසන්න	මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම.	විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම.
	පැහැදිලි කරන්න	යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම.	තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම.
	ගෙනහැර දක්වන්න	කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය.	සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම.
	අර්ථකථනය කරන්න	තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම.	යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම.
	විස්තර කරන්න	යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්.	අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම.
	සාරාංශගත කරන්න	ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්.	සංක්ෂිපතව ඉදිරිපත් කිරීම.

මට්ටම	ක්‍රියා ලැයිස්තුව	නිර්වචනය	සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්
භාවිතය අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ.	භාවිත කරන්න.	යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම.	ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම.
	ගණනය කරන්න.	ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම.	විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම.
	තීරණය කරන්න	පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම.	ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම.
	ප්‍රදර්ශනය කරන්න.	ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම.	ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම.
	පිළියෙල කරන්න.	භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම.	කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම.
	භාවිත කරන්න	සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම.	අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම.
	ඉදිරිපත් කරන්න.	සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම.	මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම.
විශ්ලේෂණය ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම	විශ්ලේෂණය කරන්න.	සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.	වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම.
	සසඳන්න	සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම.	ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම.
	වෙනස්කොට දක්වන්න	යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම.	යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම.
	පරීක්ෂා කරන්න	යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම.	යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම.
	සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.	ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දළ විශ්ලේෂණයක් ලබා දීම.
	ක්‍රියා කරන්න	අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම.	කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම.
	වාර්තා කරන්න	සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම.	විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම.

මට්ටම	ක්‍රියා ලැයිස්තුව	නිර්වචනය	සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්
අගය කරන්න නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම.	උපදෙස් දෙන්න	යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම	විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම.
	අගය කරන්න	වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම.	නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම.
	සකස් කරන්න	ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම.	හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම.
	නිර්දේශ කරන්න	සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම.	තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම.
නිර්මාණය කිරීම සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව	නිර්මාණය කරන්න	අළුත් දෙයක් නිර්මාණය කිරීම.	අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම.
	තක්සේරු කරන්න	ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම.	පවතින තොරතුරු මත පදනම්ව තර්කානුකූල විනිශ්චයන් ලබා දීම.
	සංවර්ධනය කරන්න	අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම.	කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම.
	යෝජනා කරන්න	සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම.	අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම.
	සංයෝජනය කරන්න	විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම.	විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම.
	සැලසුම් කරන්න	යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම.	නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම.
	ගොනු කරන්න	විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම.	එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

ආදර්ශ විසඳුම්

අදියර 01

1604 – ව්‍යාපාර පරිසරය [BEN]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි

වාස්ථවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)
අනිවාර්ය ප්‍රශ්න 20කි.

(මුළු ලකුණු 40)

A කොටස

1 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

1.1	-	1	**1.6**	-	1	**1.11**	-	අසත්‍ය
1.2	-	4	**1.7**	-	4	**1.12**	-	සත්‍ය
1.3	-	4	**1.8**	-	4	**1.13**	-	අසත්‍ය
1.4	-	2	**1.9**	-	4	**1.14**	-	අසත්‍ය
1.5	-	3	**1.10**	-	3	**1.15**	-	සත්‍ය

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 30)

1.16 (1) ශ්‍රී ලංකා මහ බැංකුව.

(2) බලපත්‍රලාභී වාණිජ බැංකු.

(3) රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්.

(4) සේවක අර්ථසාධක අරමුදල. **(එකකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 02)**

1.17 .

ලක්ෂණ	මුදල් වෙළඳපොළ	ප්‍රාග්ධන වෙළඳ පොළ
අරමුදල්වල කාලසීමාව	වසරකට වඩා අඩු කාලසීමාවක් ඇති කෙටිකාලීන අරමුදල් සමග ගනුදෙණු වේ.	එය වසරකට වඩා වැඩි කාලසීමාව ඇති දිගුකාලීන අරමුදල් සඳහා වෙළඳපොළකි.
අරමුදල් සැපයීම	කර්මාන්තවල වත්මන් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු වලට අදාල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ රජයේ කෙටිකාලීන අවශ්‍යතා මූල්‍යයන කිරීම සඳහා ද අරමුදල් සපයනු ලැබේ.	වෙළඳ හා වානිජ්‍ය කටයුතුවලට අදාල ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා මෙන්ම රජයේ දිගුකාලීන අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදල් සපයනු ලැබේ.
ගණුදෙණු කරන උපකරණ	වාණිජ බිල්පත්, විනිමය බිල්පත් ,භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා වැනි උපකරණ සමග කටයුතු කරයි.	ඒකක කොටස්, ණයකර, රජයේ බැදුම්කර ආදී උපකරණ සමග කටයුතු කරයි.
ප්‍රධාන ආයතනවල කාර්යභාරය	මහ බැංකුව සහ වාණිජ බැංකු මුදල් වෙළඳපොළේ ප්‍රධාන ආයතන වේ.	සංවර්ධන බැංකු සහ රක්‍ෂණ සමාගම් ප්‍රාග්ධන වෙළඳපොළ තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.
අරමුදලේ උපකරණ ලබාගැනීමේ හැකියාව	මුදල් වෙළඳපොළේ උපකරණවලට සාමාන්‍යයෙන් ද්විතියික වෙළඳපොළක් නැත.	ප්‍රාග්ධන වෙළඳපොළ උපකරණ සඳහා සාමාන්‍යයෙන් ද්විතියික වෙළඳපොළක් ඇත.
උප බෙදීම	මුදල් වෙළඳපොළ තුළ උප බෙදීමක් නොමැත.	ප්‍රාග්ධන වෙළඳපොළ තුළ ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ලෙස බෙදීමක් ඇත.
ගනුදෙනු සිදුවන ස්ථානය	ගණුදෙනු බොහෝ විට දුරකථන හරහා සිදුවන අතර විධිමත් ස්ථානයක් නොමැත.	ගණුදෙණු විධිමත් ස්ථානයක සිදුවේ. උදා : කොටස් හුවමාරුව

(එකකට 01 බැගින් ලකුණු 02)

1.18 වර්තමාන භාවිතයට මෙන්ම අනාගත පාරිභෝජනය සඳහා සම්පත් උපරිම වශයෙන් උපයෝගී කර ගනිමින් සාක්ෂාත් කරගන්නා සංවර්ධනය, තිරසාර සංවර්ධනය ලෙස හැඳින්වේ.

(ලකුණු 02)

1.19 (1) පරිසරය සක්‍රිය කිරීම.

(2) නවීන සුදුසු තාක්ෂණය.

(3) ව්‍යවසායකත්ව සංස්කෘතිය සහ කුසලතා සංවර්ධනය.

(4) මුදල් සඳහා ප්‍රවේශය.

(5) වෙළඳපොළ පහසුකම් සැපයීම.

(6) පර්යේෂණ සහ සංවර්ධනය.

(7) සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම.

(8) කලාපීය සමතුලිතතාවය. **(එකකට ලකුණු 01බැගින් ලකුණු 02)**

1.20 (1) ආර්ථික වර්ධනය සහ සංවර්ධනය.

(2) පූර්ණ සේවා නියුක්තිය.

(3) ආර්ථික ස්ථායීතාවය.

(4) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් බිහිකිරීම.

(5) යහපත් අන්තර්ජාතික වෙළදාමක් බිහි කිරීම.

(6) තිරසාර සංවර්ධනය. **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

(මුළු ලකුණු 40)

A කොටසේ අවසානය

අනිවාර්ය ප්‍රශ්න (04) කි

(මුළු ලකුණු 40)

B කොටස

02 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර

1 වන ඒකකය	–	**ව්‍යාපාරයක සංකල්ප, ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධානවලට එහි බලපෑම.**
2 වන ඒකකය	–	**විවිධ සංවිධාන වර්ග.**
ඉගෙනුම් ප්‍රතඵලය	-	ව්‍යාපාර පරිසරය හා සංවිධානයකට එහි බලපෑම පැහැදිලි කිරීම.
	-	අරමුණු, හිමිකාරීත්වය, ප්‍රමාණය, ව්‍යුහය සහ කර්මාන්තයේ ලක්‍ෂණ ඇතුළුව සංවිධානවල විවිධ වර්ගීකරණයන් පැහැදිලි කිරීම.

(a) **BrightTech Solutions** වැනි සීමාසහිත පෞද්ගලික සමාගමක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් ඇත.

සීමාසහිත පෞද්ගලික සමාගමට විශේෂිතවූ කරුණු:

(1) **සීමිත වගකීම:** ව්‍යාපාරයකට අලාභ හෝ නීතිමය ගැටළු ඇති වූ විට පුද්ගලික මූල්‍ය අවධානම අඩු කරමින්, කොටස් හිමියන්ගේ පුද්ගලික වත්කම් ආරක්ෂා කරනු ලැබේ.

(2) **පෞද්ගලික හිමිකාරත්වය:** සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් නොකරන අතර සාමාන්‍යයෙන් කුඩා පිරිසක් විසින් හිමිකාරීත්වය දරනු ලබයි, මෙමගින් තීරණ සහ උපායමාර්ග දැඩි පාලනයකින් පවත්වා ගැනීමට සමාගමට ඉඩ සලසයි.

(3) **නීතිමය පුද්ගලභාවය:** සමාගමට එහි හිමිකරුවන්ගෙන් වෙන්වූ ස්වාධීන පැවැත්මක් ඇත. සමාගමකට තම නමින් ගිවිසුම්වලට එළඹීමටත්, තම නමින් නඩු පැවරීමටත් හැකිය.

කර්මාන්තයකට විශේෂිත වූ කරුණු:

(1) **නවෝත්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම:** තාක්ෂණික අංශයේ කටයුතු කරන, **BrightTech** සමාගමට වෙළෙඳපොළ තුළ තරගකාරීව සිටිම සඳහා නිතර නවෝත්පාදන බිහිකළ යුතු අතර තම නිෂ්පාදිත වැඩි දියුණු කළ යුතුය.

(2) **කුසලතා සහිත ශ්‍රම බලකාය:** සමාගම තාක්ෂණික වශයෙන් කුසලතා ඇති සේවකයන් මත රඳා පවතින අතර, එය සමාගමේ බඳවා ගැනීමේ හා පුහුණු කිරීමේ උපායමාර්ග හැඩගස්වයි.

(3) **ක්‍රියාශීලී බව සහ අනුවර්තනය වීමේ හැකියාව:** තාක්ෂණ කර්මාන්තය තුළ වෙළඳපොළ වෙනස් වීම් වලට ඉක්මන් ප්‍රතිචාර දැක්විය යුතු අතර **BrightTech** හී ව්‍යුහය නව අදහස් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඊට ලබාදේ .

(එකකට ලකුණු 01½ , ලකුණු 03)

(b)

හිමිකාරීත්වය	එය තනි පුද්ගලයෙකු සතු වේ.
ප්‍රාග්ධනය	ප්‍රාග්ධනය හිමිකරු විසින් පමණක් යොදවනු ලබයි.
පරිපාලනය සහ තීරණ ගැනීම	ව්‍යාපාරයේ පරිපාලන කටයුතු හිමිකරු හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුකරයි. එබැවින් ව්‍යාපාරික තීරණ ඔහු විසින් ගනු ලබයි.
වගකීම	සීමිත වගකීමක් ඇත.
වෙන්වූ නීතිමය පුද්ගල භාවය	වෙන්වූ නීතිමය පුද්ගලභාවයන් නොමැත.
ලියාපදංචිය	ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
ලාභ සහ අලාභ	තනිවම බුක්ති විඳිනු ලැබේ.
බදු ගෙවීම	අයිතිකරුගේ පුද්ගලික නමින් බදු ගෙවිය යුතුය.
ගිණුම්කරණය සහ විගණනය	ගිණුම්කරණය සහ විගණනය අනිවාර්ය නොවේ.
අඛණ්ඩ පැවැත්ම	අඛණ්ඩ පැවැත්මක් නොමැත.

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03)

(c)

(1) **අරමුණ: BrightTech** හි ලාභය සහ නවෝත්පාදන කෙරෙහි එහි ද්විත්ව අවධානය යොමු කිරීම යන්නෙන් අදහස් වන්නේ සමාගම මගින් වෙළඳපොළ ඉල්ලුම සපුරාලන උසස් තත්ත්වය මෘදුකාංග විසඳුම් සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කරන බවය.

(2) **හිමිකාරීත්වය:** සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස පැවතීමෙන් සමාගම කෙරෙහි ඇතිවන පොදු වෙළඳපොළ පීඩනයන් වලකින අතර ඍජු තීරණ ගැනීමේ සහ දිගු කාලීන සැලසුම් ක්‍රියාවට නැංවීම් හැකියාවක් ඇති කරයි.

(3) **ප්‍රමාණය:** සේවකයින් 150 පිරිසක් සමග, **BrightTech** සමාගමට තම සේවක පිරිස කාර්යක්ෂමව කළමනාකරණය කළ හැකි අතර වර්ධනය හෝ වෙනස්වන දිශාවට ඉක්මනින් වෙනස්වීමට අවශ්‍ය නම්‍යශීලීත්වය පවත්වා ගත හැක.

(4) **ව්‍යුහය:** එහි ධුරාවලියේ ව්‍යුහය මගින් පැහැදිලි සේවා වාර්තාකරණයෙන් (Reporting lines) සපයනු ලබන අතර එමගින් වගවීම සහ සඵලදායී ව්‍යාපෘති කළමනාකරණයට වැඩි දියුණු කරයි.

(5) **කර්මාන්ත වර්ගීකරණය: BrightTech** ආයතනය තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු කිරීමේදී අඛණ්ඩව නැගී එන තාක්ෂණයන් අනුගමනය කිරීමටත් වෙනස් වන පාරිභෝගික අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වේ.

(සම්පූර්ණ ලකුණු ලබා ගැනීම සඳහා ලක්ෂණ (02) පමණක් ප්‍රමාණවත් වේ)

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

03 වන ඒකකය	**– ව්‍යාපාරවලට උපකාර සේවා.**
ඉගෙනුම් ප්‍රතිඵල	- උපකාරක සේවාවල කාර්යභාරය සහ වැදගත්කම පැහැදිලි කිරීම. - එක් එක් උපකාරක සේවාවන් ලක්ෂණ ලැයිස්තුගත කිරීම හා පැහැදිලි කිරීම.

(a) (1) **මෙහෙයුම් සඵලදායී ලෙස ඉහළ නැංවීම:**

ප්‍රවාහනය යනු ගනුදෙනුකරුවන්ගේ නිෂ්පාදිත හැසිරවීම, ප්‍රවාහනය කිරීම සහ ගබඩාකිරීම ඇතුළුව සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර හොඳ ප්‍රවාහන පද්ධතියක් මගින් විකල්ප කාර්යක්ෂමව සහ සඵලදායි ලෙස සිදු කිරීමට උපකාරී වේ.

(2) **භාණ්ඩ නිසි කලට බෙදා හැරීම:**

භාණ්ඩ බෙදා හැරීමට ගතවන කාලය, බෙදාහැරීමේ සේවාව, දුර සහ ගමනාන්ත රට ඇතුළු සාධක කිහිපයක් මත රඳා පවතී. කෙසේ වුවද හොඳ ප්‍රවාහන පද්ධතියක් මගින් භාණ්ඩ නියමිත වේලාවට බෙදා හැරීමට හැකි වේ.

(3) **පිරිවැය අවම වීමට හේතුවේ:**

නැව්ගත කිරීම් ඒකාබද්ධ කිරීම ඒකකයට යන ප්‍රවාහන පිරිවැය අවම කල හැකි සඵලදායි ක්‍රමයකි.එය ව්‍යාපාරයේ සමස්ත මෙහෙයුම් පිරිවැයට හේතුවේ.

(4) **අඩු මිලට හොඳ තත්වයේ භාණ්ඩ සැපයීම:**

භාණ්ඩ ආරක්ෂිතව ඇසුරුම් කර ඇති බව සහතික කිරීම සහ හොඳ තත්වයෙන් භාණ්ඩ පාරිභෝගිකයාට සැපයීම තහවුරු කිරීම. එසේම ප්‍රවාහනයේ අඩු පිරිවැය හේතුවෙන් පාරිභෝගිකයාට අඩු වියදමක් යටතේ හොඳ තත්ත්වයේ නිෂ්පාදිත ලබාගැනීමට හැකි වේ.

(5) **නියමිත වේලාවට සේවකයන් සේවයට ලගා වීම:**

බොහෝ ඇඟලුම් ආයතන තම කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් යොදවා ඇත. එබැවින් කර්මාන්තශාලා සඳහා නියමිත වේලාවට සේවකයින් ගෙන්වා ගැනීමට සමත් වී ඇත.

(6) **නිෂ්පාදන ද්‍රව්‍ය නියමිත වේලාවට කර්මාන්තශාලා වෙත වේලාවට ලබාගත හැකිවීම:**

සංවිධානවලට ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, අඩු වියදමකින් වේගවත් ප්‍රවාහන ක්‍රමයක් භාවිතා කළ හැකිය. මෙමගින් කර්මාන්ත ශාලාවලට ද්‍රව්‍ය නියමිත වේලාවට ළඟාවන බව සහතික කෙරේ. එය සමාගමේ ගනුදෙනුකරුවන් ගණන ඉහල නැංවීමට හේතුවේ.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)

(b)

(1) සම්පූර්ණත්වය

(2) සංක්ෂිප්ත බව

(3) නිශ්චිත බව

(4) ආචාරශීලී බව

(5) නිවැරදි බව

(6) රහස්‍යභාවය / ආරක්ෂාව

(7) අවම පිරිවැය

(8) සුලභතාවය

(9) වේගය **(එකකට ලකුණු ½ බැගින් ලකුණු 02)**

(c)

(1) **තත්‍ය කාල නිරීක්ෂණය (Real-time Tracking):** ගනුදෙනුකරුවන් හට බෙදා හැරීමේ නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දේ. එමගින් විනිවිදභාවය සහ විශ්වාසය වැඩි දියුණු කෙරේ.

(2) **කාර්යක්ෂම අයුරින් ගැටළු විසඳීම:** ප්‍රමාදයන් හෝ ගැටළුවලට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම මගින්, සෘණාත්මක අත්දැකීම් අඩු කරනු ලැබේ.

(3) **මෙහෙයුම් සම්බන්ධීකරණය :** රියදුරන්, ගබඩා කාර්ය මණ්ඩලය සහ කළමනාකාරීත්වය අතර සුමට සන්නිවේදනයන් සහතික කරනු ලැබේ. ව්‍යාකූල තත්වයන් සහ ප්‍රමාදයන් වළක්වනු ලබයි.

(4) **පාරිභෝගික සේවාව:** පැහැදිලි සහ කාලීන යාවත්කාලීන කිරීම් මගින් ශක්තිමත් සේවාදායක සබඳතා ගොඩනගා ගැනීමට උපකාරීවන අතර එය දිගු කාලීන සාර්ථකත්වය සඳහා වැදගත් වේ.

(5) **කීර්තිනාමය කළමනාකරණය:** හොඳ සන්නිවේදන ක්‍රමයක් මගින් සමාගමේ විශ්වාසනීයත්වය සහ පාරිභෝගිකයක් තුළ ඇති ප්‍රතිරූපය පවත්වා ගැනීමට උපකාරී වේ.

(එකකට ලකුණු 02, ලකුණු 04)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

4 වන ඒකකය	-	**ව්‍යාපාර සංවිධානවල වෙළඳාම**
ඉගෙනුම් ප්‍රතිපල	-	සිල්ලර, තොග, ආනයන සහ අපනයන වෙළඳාමේ නව ප්‍රවනතා හඳුනාගැනීම.
	-	අන්තර්ජාතික වෙළඳාම කෙරෙහි ගෝලීය පරිසරයේ බලපෑම පැහැදිලි කිරීම.

(a)

(1) **විද්‍යුත් වානිජ්‍ය සහ ඩිජිටල්කරණය :**

මාර්ගගත සාප්පු සවාරි (online shopping) සහ ඩිජිටල් වේදිකාවන් (Digital Platform) වෙත මාරු වීම මගින් ව්‍යාපාරවලට පුළුල් වෙළඳපළක් ඇතිවී තිබෙන අතර ඔවුන්ට ගෝලීය වශයෙන් ගනුදෙනුකරුවන් හා සම්බන්ධ පුළුල් පරාසයක නිෂ්පාදිත ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී ඇත. මෙහිදී, මාර්ගගත යටිතල පහසුකම්, ඩිජිටල් අලෙවිකරණ කටයුතු සහ ශක්තිමත් සැපයුම් දාම කළමනාකරණ පද්ධති සඳහා ආයෝජනය කිරීම අවශ්‍ය වේ.

(2) **පාරිභෝගිකයන්ට විශේෂිත වූ අත්දැකීම්:**

පාරිභෝගිකයන් තමන්ට විශේෂිත වූ අන්තර් ක්‍රියාකාරකම් සහ තමන්ට විශේෂිත වූ නිෂ්පාදිතයන් නිර්දේශ අපේක්ෂා කරයි. ව්‍යාපාර ආයතන විසින් දත්ත විශ්ලේෂණ සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පද්ධති උපයෝගී කරගත යුතු අතර, එමඟින් පාරිභෝගික රුචිකත්වයන් තේරුම් ගැනීමට සහ එමඟින් පාරිභෝගික රුචිය පරිදි අත්දැකීම් ලබා දීමට හැකි අතර පාරිභෝගික තෘප්තිය සහ ලැදියාව වැඩිදියුණු කෙරේ

(3) **තිරසාර භාවය සහ ආචාර ධර්ම පිළිවෙත් :**

පාරිසරික සහ සාමාජීය ගැටලු පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය ඉහළයාම මගින් තිරසාර නිෂ්පාදිත සහ ආචාරශීලී ව්‍යාපාර භාවිතයන් කෙරෙහි ඉල්ලුම මෙහෙයවනු ලබයි. පාරිභෝගික අපේක්ෂා සපුරාලීමට සහ ව්‍යාපාර ආයතනවල ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ද්‍රව්‍ය සපයා ගැනිමේ සිට නිෂ්පාදනය සහ බෙදා හැරීම දක්වා තිරසාර භාවය ව්‍යාපාරයක් මෙහෙයුම් වලට සංකලිත කර ගත යුතුය.

(4) **සැපයුම් දාම ප්‍රශස්ථිකරණය:**

වේගවත් බෙදා හැරීම් සහ නිෂ්පාදන සුලභතාවය තුළින් පාරිභෝගික ඉල්ලීම් සපුරාලීමේදී කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සැපයුම්දාමයන් ඉතා වැදගත් වේ. සැපයුම්දාමයේ දෘශ්‍යතාවය (Visibility) ඉහළ නැංවීම සහ නිෂ්පාදිත බෙදා හැරීම් නිරීක්ෂණය කිරීම සහ ප්‍රශස්ත ප්‍රවාහන සහ සැපයුම් සේවා පවත්වා ගැනීම සඳහා ව්‍යාපාර විසින් ගුටක දාම (Blokchein) සහ IOT වැනි තාක්ෂණයන් භාවිතා කෙරේ.

(5) **වෙනස්වන පාරිභෝගික රුචිකත්වයට අනුවර්තනය වීම:**

පාරිභෝගික රුචිකත්වයන් නිරන්තරයෙන් පරිණාමය වන අතර සමාජ ප්‍රවණතා, තාක්ෂණික ප්‍රගතීන් සහ සංස්කෘතික වෙනස් වීම් මේ සඳහා බලපානු ලැබේ. ව්‍යාපාර මෙම වෙනස් වීම අධීක්ෂණය කිරීමට, වෙළඳපොළ දත්ත විශ්ලේෂණය කිරීම සහ ඒ අනුව ඔවුන්ගේ නිෂ්පාදිත පිරිනැමීම සහ අලෙවි උපායමාර්ග අනුවර්තනය කිරීමත් අවශ්‍ය වේ.

(6) **ගෝලීය තරගකාරීත්වය:**

සිල්ලර සහ අපනයන වෙළඳාමේ නව ප්‍රවණතා ගෝලීය තරගකාරීත්වය තීව්‍ර කරනු ලබයි ගෝලීය වෙළඳපොළ තුළ සාර්ථක වීම සඳහා ව්‍යාපාර ආයතන විසින් තමන්ගේ අනන්‍ය නිෂ්පාදිත පිරිනැමීම්, විශේෂිත පාරිභෝගික සේවාවක්, කාර්යක්ෂම මෙහෙයුම් හරහා ව්‍යාපාර විශේෂණය (Differentiate) කළ යුතුවේ.

(7) **නියාමන භූ දර්ශනයේ සැරිසැරීම:**

ජාත්‍යන්තර වෙළඳාම විවිධ රෙගුලාසි සහ අනුකූලතා අවශ්‍යතාවයන්ට යටත් වේ. සුමට මෙහෙයුම් සහිතික කිරීම සහ නීතිමය සංකූලතා වළක්වා ගැනීම සඳහා ව්‍යාපාර විසින් වෙළඳ නීති, තීරුබදු සහ අනෙකුත් රෙගුලාසි පිළිබඳව දැනුවත් විය යුතුය.

(8) **නවෝත්පාදනය සහ තාක්ෂණයට අනුගත වීම:**

සෑම විටම ඉදිරියෙන් සිටීම සඳහා ව්‍යාපාර විසින් නිරන්තර නවෝත්පාදනය සහ නව තාක්ෂණය අනුගමනය කළ යුතුය. ව්‍යාපාර විසින් පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ආයෝජනය කළ යුතු අතර නව තාක්ෂණයන් අත්හදා බැලිය යුතු අතර, වෙනස් වන තාක්ෂණික පරිසරයට අනුවර්තනය වීමට කැමැත්තෙන් සිටිය යුතුය.

(9) **ශක්තිමත් වෙළඳ සන්නාමයන් ගොඩනැගීම:**

තරගකාරී වෙළඳපොලක් තුළ, ශක්තිමත් සන්නාම අනන්‍යතාවයක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාර ආයතන විසින් අනන්‍ය වූ සන්නාම පෞරුෂයක් වර්ධනය කිරීම අවශ්‍ය වන අතර, ඔවුන්ගේ වටිනාකම් සඵලදායි ලෙස සන්නිවේදනය කිරීම සහ ශක්තිමත් පාරිභෝගික සබඳතා වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(10) **පාරිභෝගික අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කිරීම:**

ධනාත්මක පාරිභෝගික අත්දැකීම් නිර්මාණය කිරීම සාර්ථකත්වයට ඉතා අත්‍යවශ්‍යය. ව්‍යාපාර විසින් මූලික පර්යේෂණයේ සිට පශ්චාත් මිලදී ගැනීමේ සහාය දක්වා වූ සෑම ස්පර්ශක ස්ථානයකදීම පාරිභෝගික තෘප්තියට ප්‍රමුඛත්වය දිය යුතුය.

(ලකුණු 02 බැගින්, ලකුණු 06)

(b) ගෝලීය පරිසරය, වෙළඳ ප්‍රතිපත්ති, පාරිභෝගික හැසිරීම් සහ පාරිසරික ප්‍රමිතීන්ට බලපෑම් කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ මෙහි ප්‍රතිඵල වශයෙන්:

- **පරිසර හිතකාකාමී ආනයනඃ** දේශීය ව්‍යාපාර විසින් ගෝලීය පාරිසරික ප්‍රමිතීන් වලට අනුකූලවීම සඳහා තිරසාර ඇසුරුම් ආනයනය කරයි.
- **අපනයන උපායමාර්ගවලට සිදුකරන ගැලපීම්: සීමාසහිත Lanka oganic (පෞද්ගලික) සමාගම** වැනි සමාගම් විසින් තම නිෂ්පාදිත (කාබනික තේ සහ කුළුබඩු වැනි) ජාත්‍යන්තර ප්‍රවණතාවන් අනුව කාබනික නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අනුව සකස් කර ගනිමින් විදේශීය වෙළඳපොළවල් තුළ ඔවුන්ගේ අවස්ථා වැඩි දියුණු කර ගනියි.
- **අනුකූල වීමේ පීඩනය Compliance Pressure:** විදේශීය වෙළඳපොළවල් වලට ප්‍රවේශ වීම පවත්වා ගැනීම සඳහා සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් ජාත්‍යන්තර වෙළෙඳ රෙගුලාසි වලට අනුගත විය යුතුය.

(ලකුණු 02 බැගින්, ලකුණු 04)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

06 වන ඒකකය	-	**ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයේ හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල (SMES) දයකත්වය**
ඉගෙනුම් ප්‍රතිඵල	-	ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවායකත්වයේ හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වැදගත්කම පැහැදිලි කිරීම.
	-	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්යසාධනය වැඩි කිරීමට දී ඇති පහසුකම් හා සහාය ලැයිස්තුගත කිරීම.

(a)

(1) "එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා" යෝජනා ක්‍රමය මගින් **තරිඳුට** නිෂ්පාදන කටයුතුවලට අත්‍යවශ්‍ය ප්‍රාග්ධනය සඳහා ආරම්භක ණය මුදලක් ලැබුණි.

(2) ඔහු NEDA වෙතින් ලද පුහුණුවෙන් ප්‍රතිලාභ ලබාගත් අතර, අළෙවිකරණය සහ මූල්‍ය කටයුතු පිළිබඳ ඔහුගේ කුසලතා වැඩිදියුණු කරගනු ලැබීය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ආයතනික පිළිගැනීම හේතුවෙන් ගෝලීය වෙළඳ ප්‍රදර්ශනයෙහි ඔහුගේ නිෂ්පාදිත ප්‍රදර්ශනය කිරීමෙන් ජාත්‍යන්තර අත්දැකීමක් ඔහුට ලබා ගත හැකි විය.

(3) ඔහු ලද අරමුදල්, දැනුම සහ සහයෝගය යන සංකලනයන් මගින් ඔහුට තම ව්‍යාපාරය වර්ධනය කර ගැනීමටත්, නව වෙළෙඳපොළවල් වෙත ප්‍රවේශ වීමට සහ ආර්ථික සංවර්ධනයට දායක වීමටත් ඉඩ සලසනු ලබයි.

(ලකුණු 02 බැගින්, ලකුණු 04)

(b)

(1) **රැකියා උත්පාදනය:** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මඟින් එම ප්‍රදේශවල පුද්ගලයන් සේවයේ යොදවන අතර, එමගින් විරැකියාව අවම කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීමට උපකාරී වේ.

(2) **අපනයන වර්ධනය:** ගෝලීය වෙළඳපොළවල්වලට පිවිසීම මගින් **තරිඳු** වැනි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විදේශ මුදල් උපයනු ලබන අතර, රටේ වෙළෙඳ ආදායම ඉහළ නංවයි. මෙමඟින්, පරිසර හිතකාමී භාණ්ඩ අපනයනකරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයද ප්‍රවර්ධනය කරයි.

(3) **නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම:** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝ විට නව්‍ය නිෂ්පාදිත වෙළඳපොළට ගෙන යනු ලැබේ. පරිසර හිතකාමී කොහු ආශ්‍රිත අයිතම තිරසාර නවෝත්පාදනය ප්‍රවර්ධනය කෙරේ.

(4) **ග්‍රාමීය සහ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සහය:** බොහොමයක් කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාර ප්‍රධාන නගරවලින් පිටත පිහිටා ඇත. **තරිඳු** වැනි ව්‍යාපාර ගාල්ල වැනි ප්‍රදේශවල ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීමට උපකාරී වන අතර, ජාතික සංවර්ධනය සමතුලිත කිරීමට දායක වෙයි.

(5) **දේශීය සම්පත් භාවිතය:** මිලදී ගැනීමේ ශක්තිය ඉහල නැංවීම සහ ආර්ථික වර්ධනයට සහ පූර්ණ සේවා නියුක්තියට වැඩි දායකත්වයක් ලබාදීම.

(6) **බදු නිසිලෙස ගෙවීම:** බදු ගෙවීම තුළින් රජයට අවශ්‍ය අරමුදල් සැපයීම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 06)

(මුළු ලකුණු 10)

B කොටසේ අවසානය

අනිවාර්ය ප්‍රශ්නයකි.

C කොටස

(මුළු ලකුණු 20)

06 - වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

01 වන ඒකකය	–	**ව්‍යාපාරයක සංකල්ප, ව්‍යාපාරික පරිසරය සහ ව්‍යාපාර සංවිධාන කෙරෙහි එහි බලපෑම.**
02 වන ඒකකය	–	**විවිධ සංවිධාන වර්ග.**
03 වන ඒකකය	–	**ව්‍යාපාරවලට උපකාරක සේවා.**
06 වන ඒකකය	–	**ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්ව සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගේ (SMES) දායකත්වය.**
ඉගෙනුම් ප්‍රතිඵල	-	ශදුඅත (SWOT) සහ PESTLE විශ්ලේෂණ භාවිතයෙන් ව්‍යාපාර පරිසරය තක්සේරු කිරීම.
	-	එක් එක් සංවිධාන වර්ගයේ වාසි සහ අවාසි පැහැදිලි කිරීම.
	-	එක් එක් උපකාරක සේවාවන්හි ලක්ෂණ ලැයිස්තුගත කර පැහැදිලි කිරීම.
	-	ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය මුහුණපාන අභියෝග පැහැදිලි කිරීම.
	-	ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන් සහ ඔවුන්ගේ ව්‍යාපාරයට වන බලපෑම් හඳුනා ගැනීම.

(a) (1) **ශක්තින්:**

- සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් පාරිභෝගිකයන්ට, සොයාගැනීමට අපහසු කාබනික නිෂ්පාදිතවල පුළුල් පරාසයක් ඉදිරිපත් කිරීම.
- ශක්තිමත් වෙළඳ සන්නාමයන් පැවතීමත් සහ දැඩි තදබදයක් සහිත ප්‍රදේශයක උපායමාර්ගික ස්ථානය පැවතීම.

(2) **දුර්වලතා:**

- කාබනික අමුද්‍රව්‍ය ලබා ගැනීම් නිසා සිදුවන ඉහළ මෙහෙයුම් පිරිවැය.
- ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් නොමැති වීම සහ මාර්ගගත පැවැත්ම මූලික මට්ටමේ පැවතිම.

(3) **අවස්ථාවන්:**

- සෞඛ්‍ය සම්පන්න කාබනික නිෂ්පාදිත සඳහා ඇති ගෝලීය ඉල්ලුම ඉහළ යෑම් නිසා වර්ධනය වීමට හැකිවීම.
- අඛණ්ඩ පර්යේෂණ හා සංවර්ධනය තුළින් මාර්ගගත විකුණුම් පුළුල් කිරීම සහ නව නිෂ්පාදිත හඳුන්වා දීමට ඇති හැකියාව.

(4) **තර්ජන :**

- පවතින රෙගුලාසි වෙනස්වීම සහ පිරිවැය ඉහළ යාම නිසා ලාභ ආන්තිකය අඩුවීම.
- මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශ වීම සහ ජාත්‍යන්තර වෙළඳපොළ පුළුල් කිරීමේ දුෂ්කරතා.

(ලකුණු 06)

(b) සීමිත පෞද්ගලික සමාගම්වල ඇති වාසි:

(1) පවුල තුළ ඥාතීන්ගේ අයිතිවාසිකම් පවත්වා ගැනීමේ හැකියාව.

(2) සීමිත පිරිසක් අතර සමාගමේ පාලනය රඳවා ගැනීමේ හැකියාව.

(3) සීමිත පිරිසක් අතර ලාභ බෙදා ගත හැකිවීම.

(4) වැඩි ප්‍රාග්ධනයන් රැස් කරගත හැකිවීම.

(5) වගකීම සීමිත වීම.

(6) නීතිමය පුද්ගලභාවයක් හිමිවීම.

(7) පොදු සමාගම් හා සසඳන විට නීතිමය බලපෑම් අවම වීම.

(8) ව්‍යාපාරයක අඛණ්ඩ පැවැත්මත් තිබීම. (අඛණ්ඩතා සංකල්පය)

(9) කළමනාකාරිත්ව මණ්ඩලයන් මගින් සඵලදායි ලෙස කළමනාකරණ කිරීම.

(10) සියළුම කොටස් හිමියන්ගේ ඒකමතික යෝජනාවකින් තොරව සමාගමේ බොහෝ කාර්යයන් ඉටු කිරීමේ හැකියාව.

(11) නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂණයකින් තොරව කොටස් හිමියන්ට ලාභාංශ බෙදා හැරීමේ හැකියාව.

(12) විවිධ බදු දිරිගැන්වීම්. **(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)**

සීමිත පෞද්ගලික සමාගම්වල අවාසි:

(1) පොදු සමාගම් හා සසඳන විට අඩු ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිය.

(2) කොටස් වෙළඳපළේ ලැයිස්තුගත කළ නොහැක/නිල ලැයිස්තුගත සමාගමක් විය නොහැක.

(3) කොටස් නිදහසේ හුවමාරු කළ නොහැක.

(4) සමාගම් පනතේ නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු වීම.

(5) සංස්ථාපනය කිරීම සංකීර්ණ හා මිල අධික විය හැකියි.

(6) පරිපාලන පිරිවැය අධික වීම.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)

(c) .

(1) බැංකුකරණය.

(2) සන්නිවේදනය.

(3) රක්ෂණය.

(4) ප්‍රවාහනය.

(5) සැපයුම් සේවා (Logistics). **(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)**

(d) (1) **කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල තරගකාරීත්වය සඳහා උපාය මාර්ගික සම්පත් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඉතා වැදගත් වීම:**

යම් යම් බාධක සහ වෙළඳපොළ අසාර්ථකත්වයන් මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන් මූල්‍ය, කළමනාකරණ හැකියාව සහ කුසලතා සහ දැනුම් ජාල ඇතුළු, උපාය මාර්ගික සම්පත් වෙත ප්‍රවේශ වීම වළක්වන අතර, එමගින් ගෝලීය හා ඩිජිටල්කරණය වූ ආර්ථිකය තුළ තරගකාරීත්වයේදී අවාසි තත්ත්වයට පත්කරනු ලබයි.

(2) **කුසලතා හිගය, දුර්වල කළමනාකරණ පිළිවෙත් සහ ශ්‍රම බලකා පුහුණුවේ පවතින සීමාවන් මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල ඵලදායිතාවය සහ නවෝත්පාදනය සීමා කරයි:**

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන්ට විශාල සමාගම්වලට සාපේක්ෂව කුසලතාවයන්හි හිඟයක් ඇති බවට සාක්ෂි ඇති අතර, එක් සේවකයකු සඳහා සාමාන්‍ය පුහුණුව ඉතා අඩු අගයක පවතී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර විසින් කුසලතා ඇති ඉහළ සුදුසුකම් ලත් පිරිස් සහ කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමේ සහ රඳවා ගැනීමේ අභියෝගයන්ට මුහුණ පාන අතර, ශ්‍රම වෙළඳපොළ තුළ අපේක්ෂිත කුසලතා ඇති සේවකයන් හඳුනා ගැනීම දුෂ්කරතාවයන්ට මුහුණපානු ලැබේ.

(3) **ඩිජිටල්කරණය මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ගෝලීය ආර්ථිකයට සහභාගී වීමට නව අවස්ථා ලබා දේ:**

ඩිජිටල් තාක්ෂණය මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට වෙළඳපොළ පිළිබඳ බුද්ධිය වැඩිදියුණු කිරීම සහ පරිමාව ඉහළ නංවා ගැනීමටත්, සාපේක්ෂව අඩු පිරිවැයකින් ගෝලීය වෙළෙඳපොළ සහ ඇනවුම් ප්‍රමාණයක් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසනු ලබයි. ඩිජිටල් පරිවර්තනය තුළින් කුඩා ව්‍යාපාර බිහිවීමට පහසුකම් සපයන අතර, නිෂ්පාදන හෝ සේවා නවෝත්පාදනය සහ වැඩි දියුණු කළ නිෂ්පාදන ක්‍රියාවලින් හරහා දේශීය හා ගෝලීය වෙළඳපළ තුළ ඔවුන්ගේ තරගකාරීත්වය වැඩි දියුණු කිරීමට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට නව අවස්ථා සපයනු ලබයි.

(4) ගෝලීයකරණය සහ ආර්ථික ඒකාබද්ධතාවය හේතුවෙන් බහුජාතික ව්‍යවසායකයන්ගේ වෙළඳපොළ තරගකාරීත්වය වැඩිවීම විශාල සමාගම්වල පර්යේෂණ සහ සංවර්ධන වියදම් සහ නවෝත්පාදන (නිෂ්පාදිත ක්‍රියාවලිය සහ සංවිධානය) නිසා තරඟ කිරීමට නොහැකිවීම.

(එකකට ලකුණු 1½ බැගින්, උපරිම ලකුණු 03)

(e)

(1) **පාරිභෝගිකයින්:**

- සෞඛ්‍ය සම්පන්න ගුණාත්මක නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම නිෂ්පාදන තීරණ කෙරෙහි බලපෑම ඇතිකරනු ලබයි.
- කාබනික නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම, විකුණුම් සහ නිෂ්පාදන සංවර්ධනය ඉහළ නංවයි.

(2) **සැපයුම්කරුවන් :** කාබනික අමුද්‍රව්‍ය නියමිත වේලාවට විශ්වාසනීය ලෙස බෙදා හැරීම සහතික කරයි.

(3) **සේවකයන්:** ඔවුන්ගේ කුසලතා සහ අභිප්‍රේරණය ඵලදායීතාවය සහ නවෝත්පාදනයට සෘජුවම බලපාන අතර දෛනික මෙහෙයුම් සුමට කරවයි.

(4) **රාජ්‍ය සහ ආයෝජකයන්:** ව්‍යාපාර මෙහෙයුම් සහ වර්ධනය හැකියාව හැඩගැස්වීම සඳහා නියාමන මාර්ගෝපදේශ සහ අරමුදල් සහය ලබාදීම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)

(මුළු ලකුණු 20)

C කොටසේ අවසානය